# රජයේ වාරිමාර්ග ප්‍රතිපත්තිය

## වන සම්පත් වාරිමාර්ග සහ මහවැලි සංවර්ධනය පිළිබඳ ඇමති ගරු. ගාමිණී අතුකෝරළ මැතිතුමන් සමග කරන ලද සාකච්ඡාව.

**ප්‍රශ්නය :-**

වන සම්පත් වාරිමාර්ග හා මහවැලි සංවර්ධන ඇමතිතුමා වශයෙන් ගොවි දිනයේ දී ඔබ තුමා ගොවීන්ට දෙන පණිවුඩය කුමක් ද?

**පිළිතුර :-**

ගොවි දිනයේ දී ගොවි මහතුන්ට දිය හැකි උසස්ම පණිවුඩය වන්නේ "මනා ජල කළමණාකාරීත්වයක් තුළින් තිබෙන භූමි ප්‍රමාණයෙන් උපරිම නිෂ්පාදනයක් ලබා ගැනීමට කටයුතු කිරීමයි". 1970 දශකයේ මුල් භාගයේ මෙරට ජනගහණය ලක්‍ෂ 120 ක් ද, 1993 දී එය ලක්‍ෂ 170 ක් ද වූ අතර නියමිත සංඛ්‍යාලේඛන අනුව 2012 දී ලක්‍ෂ 220 ක් ද වනු ඇත. නමුත් පවතින භාවිතා කළහැකි භූමි ප්‍රමාණය ක්‍රමයෙන් සීමා වේ. එබැවින් පවතින ජල ප්‍රමාණය අපතේ නොයවා උපරිම භූමි ප්‍රමාණයන් වාරි පෝෂණය කර ප්‍රසස්ථ නිෂ්පාදනයන් කළ යුතු යි.

**ප්‍රශ්නය :-**

වියළි කලාපයේ ගොවිතැන දියුණු කිරීමට ඇති ප්‍රධාන අභියෝගය වී ඇත්තේ ජල හිඟයයි. මෙම අභියෝගය ජය ගැනීමට රජයේ වාරිමාර්ග ප්‍රතිපත්තියෙන් ඉදිරිපත් වන උපක්‍රම මොනවාද?

**පිළිතුර :-**

මෙහිදී වී ගොවිතැනට පමණක් අවධානය යොමු නොකර සියළු වගාවන් ගැන සැලකිය යුතුයි. උතුරු නැගෙනහිර යථා තත්ත්වයක ඇත්නම් හා "බී" කලාපයේ වගාවන් කළ හැකි නම් ලංකාව බොහෝදුරට වී වලින් ස්වයංපෝෂිත බව පෙනී යන කරුණක්. එමෙන්ම "එච්" කලාපය, මහවිලච්චිය, මහකනදරාව හා වයඹ වැනි ප්‍රදේශවල නිසි ලෙස වාරිමාර්ග පද්ධති පැවතුන ද ජලය නොමැතිකම නිසා වගා කටයුතු කළ නොහැකිව පවතිනවා. උදහරණයක් ලෙස මහකනදරාව සැලකූ විට කන්න 55 කින් සාර්ථකව වගා කළ හැකිව ඇත්තේ කන්න හතක් හෝ අටක් පමණි. එබැවින් වයඹට හා උතුරුමැද පළාතට ජලය ලබාදීමට කළු ගඟ (ලග්ගල) යෝජනා ක්‍රමය ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. වයඹ විශේෂ ජල සම්පත් ව්‍යාපෘතිය සඳහා රුපියල් දශලක්‍ෂ 2000 ක් පමණ වැය කර විශාල මධ්‍යම හා කුඩා යෝජනා ක්‍රම 662 ක් ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමටත් කෘෂි ළිං 1500 ක් සෑදීමත් කරගෙන යයි. මෑත දී ආරම්භ කළ ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා ද රුපියල් දශ ලක්‍ෂ 2000 ක් යොදවමින් මධ්‍ය හා කුඩා වැව් 1060 ක් පමණ පුනරුත්ථාපනය කරගෙන යනවා.

**ප්‍රශ්නය :-**

වාරිමාර්ග පද්ධතිවල නඩත්තුව හා මෙහෙයුම් කටයුතු ගොවි සංවිධානවලට පැවරීමෙන් රජය අපේක්‍ෂා කරන්නේ කුමක් ද?

**පිළිතුර :-**

වාරි පද්ධති මනාව නඩත්තු කිරීමත් ගොවීන් වෙනුවෙන් වැයකරන මුදලින් උපරිම ලාභයක් ලබා ගැනීමත් රජයේ අපේක්‍ෂාව වේ. ජලපාලනය මනාව හා කාර්යක්‍ෂමව කිරීමට ගොවීන් සහභාගී කරගත යුතු ය. එය ගොවි සංවිධාන මගින් ඉටු කිරීමට අපේක්‍ෂා කෙරේ.

**ප්‍රශ්නය :-**

පසුගිය වකවානුව තුළ ගොවි සංවිධාන කරන ලද කාර්යය ගැන ඔබතුමා සෑහීමකට පත් වෙනවාද?

**පිළිතුර :-**

ගොවි සංවිධානවල මූලික කාර්යය ජල පාලනය මනාව උපරිම කාර්යක්‍ෂමතාවයකින් සිදුකර, සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමයි. බොහෝ ගොවි සංවිධාන ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන් විශාල ව්‍යාපාර වන පරාක්‍රම සමුද්‍රය, කවුඩුල්ල හා "එච්" කලාපයේ ගොවි සංවිධාන ජලපාලනය හා නඩත්තු කටයුතු ඉක්මවා යමින් ගොවීන්ට කෘෂි සැපයුම් ලබාදෙන හා කෘෂි නිෂ්පාදන මිලට ගන්නා සංවිධාන බවට පත් වී තිබෙනවා.

**ප්‍රශ්නය :-**

අනාගතයේ දී සියළු වාරිමාර්ග පද්ධතිවල මෙහෙයුම් කටයුතු ගොවි සංවිධානවලට පැවරීමට රජය අපේක්‍ෂා කරන්නේ නම් ඒ මට්ටමට ගොවි සංවිධාන ශක්තිමත් වී ඇතැයි ඔබ සිතන්නේ ද?

**පිළිතුර :-**

ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වයට බාධාවන තත්ත්වයන් ඉවත් කිරීමට අවශ්‍ය පියවර කඩිනම්ව ගත යුතු යි. ඒවා ශක්තිමත් කිරීමට අවශ්‍ය බලතල ලබාදිය යුතුයි. ගොවි සංවිධානවලට තවදුරටත් ස්වාධීනව කටයුතු කිරීමට ඉඩ ලබා දිය යුතු යි. රජය මගින් ජලය සැපයීමේ මූලික කටයුතු පමණක් සිදුකර බෙදුම් ඇළ පමණක් නොව ප්‍රධාන ඇල ආශ්‍රිත පාලනය හා වගකීම ද ගොවි සංවිධානවලට පැවරිය යුතු යි. මෙම කටයුතු සඳහා ගොවීන් පුහුණු කළ යුතු යි. නමුත් එය මාස දෙක තුනක් වැනි කෙටි කාලයක් තුළ කළ හැකි දෙයක් නොවේ.

**ප්‍රශ්නය :-**

ගොවි සංවිධානවලට යම් තරමක නීතිමය බලතල පවරා ඇතත්, එම නීති ක්‍රියාත්මක කිරීම අපහසු බව ගොවි සංවිධාන නියෝජිතයන්ගේ අදහසයි. මෙය ඉවත් කළ හැක්කේ කෙසේ ද?

**පිළිතුර :-**

පරාක්‍රම සමුද්‍රය, කවුඩුල්ල වැනි ව්‍යාපාරවල ගොවි සංවිධාන කටයුතු කිරීමේ දී යම් යම් ගැටළු සිදු වී තිබෙනවා. නමුත් වාරිමාර්ග ආඥා පනත සංශෝධනයවූ විට මෙම ප්‍රශ්න විසදේවී.

**ප්‍රශ්නය :-**

වාරිමාර්ග පුනරුත්ථාපන වැඩපිළිවෙල සාර්ථක ද? ඒ පිළිබඳව ඔබතුමාට යමක් කිව හැකි ද?

**පිළිතුර:-**

බහුතරයක් සාර්ථකයි. මෙම වාරිමාර්ග පුනරුත්ථාපන වැඩපිළිවෙල සාර්ථක වීමට ගොවීන්ගේ සහයෝගය හා අනුග්‍රහය ලැබිය යුතු යි. බොහෝ ප්‍රදේශවල එය ඉතාමත් සාර්ථකව සිදුවෙනවා.

**ප්‍රශ්නය :-**

සහභාගීත්ව පාලන ක්‍රමය වාරිමාර්ග කටයුතු සම්බන්ධ ප්‍රධාන උපක්‍රමය වශයෙන් භාවිතා කිරීම කොතරම් දුරට සාර්ථක වී තිබේ ද?

**පිළිතුර :-**

ගොවි සංවිධානවල පවතින ශක්තිය අනුව එනම් මහජන සහභාගීත්වය අනුව එය තීරණය වේ. ජලය සැපයීම පමණක් රජයෙන් සිදු කරමින් අනෙක් සියළු කටයුතු ගොවීන්ට පැවරිය යුතු ය. නිලධාරීන් එම කාර්යයන්ගෙන් ක්‍රමයෙන් ඉවත්විය යුතු යි. පරාක්‍රම සමුද්‍රය හා කවුඩුල්ල වැනි ව්‍යපාර වල මෙම සහභාගීත්ව පාලන ක්‍රමය සාර්ථකව ක්‍රියාවට නැගීමෙන් සම්පත් ආරක්ෂා කරගෙන ඇත. ජලපාලනය කාර්යක්ෂමව සිදු කිරීමට සහභාගීත්ව පාලන ක්‍රමය ඉතාමත් සාර්ථක ක්‍රමයකි. නමුත් එයට පවතින විවිධ බාධක ඉවත් කිරීම මගින් ගොවි සංවිධාන දුර්වලවීම වැළැක්විය යුතු යි.

**ප්‍රශ්නය:-**

ඔබතුමාගේ අමාත්‍යාංශය මගින් පසුගිය වකවානුවතුළ සිදුකළ කටයුතු කෙටියෙන් සඳහන් කරනවා ද?

**පිළිතුර :-**

1977 සිට 1993 දක්වා කාලසීමාව තුළ ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය හා මහා වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය මගින් අලුතින් අක්කර 2,15000 ක් වාරිපෝෂිත කළ අතර, පුනරුත්ථාපනය කර ඇති අක්කර ගණන 6,15,000 කි. මීට අමතරව ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

**ප්‍රශ්නය:-**

මෙයට අතිරේකව ඔබතුමා ලාංකීක ගොවියාට ලබාදෙන පණිවුඩය කුමක් ද?

**පිළිතුර :-**

දැනට වී වගාවෙන් ආසන්න ස්වයංපෝෂිත මට්ටමක ලංකාව පවතින නිසා තවදුරටත් වී වගාව වර්ධනය කිරීමට වඩා අතිරේක බෝග වගාවට ගොවීන් නැඹුරු කිරීම උචිත බව මගේ අදහසයි. සුළු වාරිමාර්ග හා වර්ෂාපෝෂිත කුඹුරුවල පවතින භූමියෙන් වඩා වැඩි අස්වැන්නක් (හෙක්ටයාරයට මෙ.ටොන් 4.5 දක්වා වැඩි කිරීමට) ලබාගත හැකි නම් එය වඩාත් හිතකර වනු ඇත. එලෙසින් ගොවියාගේ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීමට හැකිවුවහොත් එය වඩාත් ඵලදායී වේ.

සාකච්ඡා කළේ

ජී. එම්. හේනේගෙදර.
ඩබ්. එම්. ජී. බී. ගිරාගම


# 1993

# ජාතික ගොවි දිනයට අපගේ උපහාරය

**ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීමේ ආයතනය**